පොදු චක්‍රලේඛ ලිපි අංක - 02-155/2013

මගේ අංකය - ටීජ්/එස්ජ්/08/2013,
සෞඛ්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය",
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ-10.
2013.10. 12

21 OCT 2013

සියළුම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන්,
සියළුම පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්,
සියළුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන්,
සියළුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන්,
සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය වන සියළුම රෝහල් හා ආයතන ප්‍රධානීන්,

**ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ වෛද්‍ය රසායනාගාර විද්‍යාවේදී හා ඖෂධවේදී උපාධි සඳහා අධ්‍යයන නිවාඩු අනුමත කිරීම**

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ ලියාපදිංචි වීමෙන් පසුව වෛද්‍ය රසායනාගාර විද්‍යාවේදී හා ඖෂධවේදී උපාධි පාඨමාලා හදාරන වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ හා ඖෂධවේදී නිලධාරීන් සඳහා එම විශ්ව විද්‍යාලය මඟින් පවත්වනු ලබන දේශන/ප්‍රායෝගික සැසි වාර/ හා විභාග වලට සුදානම් වීමට වර්ෂයකට දින 20 ක අධ්‍යයන නිවාඩු 2013.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අනුමත කරන බව මෙයින් දන්වා සිටිමි.

02. මෙම චක්‍රලේඛය අනුව අධ්‍යයන නිවාඩු ලබාදීමේ දී ආයතනයේ රාජකාරි වලට බාධාවක් නොවන අයුරින් නිවාඩු අනුමත කිරීමට ආයතන ප්‍රධානියා වග බලාගත යුතු වේ.

වෛද්‍ය, වයි.ඩී. නිහාල් ජයතිලක,
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.